# දර පාවිච්චිය සඳහා වඩා කාර්යක්ෂම වූ අවම කාබන් විසඳුමක් :

# 'අනගි' ලිප

ශ්‍රී ලංකාවේ බලශක්ති සහ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමෙහි ලා ජෛවස්කන්ධ (දර) සඳහා ප්‍රමුඛස්ථානයක් හිමි වේ. දර, දේශීය ව පහසුවෙන් සපයාගත හැකි, අඩු වියදම්, පුනර්ජනනීය ස්වාභාවික සම්පතක් වීම මීට හේතුවයි. ශ්‍රී ලංකාවේ 75%කට අධික ජනතාවක් තවමත් තම දෛනික ආහාර පිසීම සඳහා දර ප්‍රධාන ඉන්ධනයක් ලෙස භාවිත කරයි. දර භාවිතය බහුතර ග්‍රාමීය ප්‍රජාව අතර වඩා ජනප්‍රිය වුවත්, නාගරික ජනතාව අතර ද සැලකිය යුතු පිරිසක් දර පාවිච්චියේ යෙදෙති. පිටරටින් ආනයනය කරනු ලබන වඩා කාර්යක්ෂම LP ගෑස්, භූමිතෙල් භාවිතාව ප්‍රවර්ධනය කිරීමේ කටයුතු බහුල ව සිදු වුව ද, ඒවායේ මිල දැරීමට තරම් ආර්ථිකමය ලෙස ශක්තිමත්භාවයක් ශ්‍රී ලංකාවේ බහුතරයකට නොමැති වීම, අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර නො ගැනීමට හේතු වී ඇත. අනෙක් අතට ආනයනික බලශක්ති ප්‍රවාහයන්ට සීමාව ඉක්මවා යොමු වීම ද දීර්ඝකාලීන ව රටක බලශක්ති සුරක්ෂිතතාවට



'අනගි' ලිප



තර්ජනයක් විය හැකි කරුණකි.

මෙවැනි වාතාවරණයක් තුළ දේශීය සම්පතක් වන දර සම්පත අධි පරිභෝජනය සීමා කිරීමට හා බලශක්ති සංරක්ෂණයට ඉවහල් වන කාර්යක්ෂම හා අඩු වියදම් ආහාර පිසීමේ තාක්ෂණයන් හඳුන්වා දීම කාලීන අවශ්‍යතාවකි.

ශ්‍රී ලංකාවේ බහුතරයක් තවමත් සාම්ප්‍රදායික ගල් තුනේ දර ලිප් සහ පාරම්පරික මඩ ලිප් භාවිත කිරීමට යොමු වී සිටිති. මේ උදුන් භාවිතයෙන් මහා පරිමාණයෙන් දර බලශක්තිය අපතේ යෑමක් සිදු වෙයි. තව ද මේ ලිප්වල දර දුම අධික නිසා සෞඛ්‍යයට වන බලපෑම ද සුළුපටු නො වේ.

### ග්‍රාමීය අකාර්යක්ෂම ලිප් භාවිතය

කාර්යක්ෂම වැඩිදියුණු කරන ලද ලිප් ප්‍රවර්ධනය සඳහා විවිධ ක්‍රියාමාර්ග ගැනුණ ද, ඒ අතර වඩාත් සාර්ථක වූ විසඳුම ලෙස 'අනගි' ලිප හැඳින්විය හැකි ය. ශ්‍රී ලංකාවේ සැලකිය යුතු ජනතාවක් මේ ලිප පාවිච්චියට යොමු වී ඇත. වාර්ෂිකව උදුන් 300,000ක් පමණ මිල දී ගැනෙයි. පාරම්පරික හා ප්‍රාථමික වූ ගල් තුනේ ලිප් හා මඩ ලිප් භාවිත කරන්නන් වැඩිදියුණු කරන ලද 'අනගි' උදුන භාවිතයට යොමු කිරීමත්, දැනටමත් 'අනගි' උදුන භාවිත කරන්නන් එම උදුනෙන් උපරිම ප්‍රතිලාභ ගන්නා ආකාරය පිළිබඳව දැනුවත් කිරීමත් මෙවර ලිපියේ ප්‍රධාන අරමුණක් වේ. තව ද 'අනගි' උදුනේ තාක්ෂණික පැතිකඩ පිළිබඳව පාසල් සිසුන්ට අවබෝධයක් ලබා දීමත්, ඔවුන් නව නිර්මාණකරුවන් ලෙස මේ දර කාර්යක්ෂමව භාවිත කිරීමේ ප්‍රයත්නයට දායක කරගැනීමට පෙලඹවීමත් මේ ලිපියේ තවත් ප්‍රධාන අරමුණකි.

### 'අනගි' උදුනේ පසුබිම

සර්වෝදය ආයතනයේ වසර කිහිපයක පර්යේෂණ මෙහෙයුමක ප්‍රතිඵලයක් ලෙස 'අනගි' දර උදුන 1987 වර්ෂයේ දී නිර්මාණය වූවකි. මේ නිර්මාණ ක්‍රියාවලියේ විශේෂත්වය වන්නේ, තාක්ෂණික මෙන්ම සාමාජීය, ආර්ථිකමය සහ අනෙකුත් පාරිසරික කාරණාවලට ද සම අවධානයක් දීමයි. තව ද එම උදුන නිර්මාණයෙහි ලා ග්‍රාමීය ප්‍රජාව ද ඉතා සක්‍රිය ව දායක කරගැනීම විශේෂත්වයකි. ශ්‍රී ලංකාව තුළ 'අනගි' උදුන සාර්ථක ව සමාජගත කිරීමට හා මේ දක්වා නිෂ්පාදනය කර බෙදා හැරීමට ඉහත කී සාධක ඉවහල් වී ඇත.

### නිර්මාණය හා තාක්ෂණික තොරතුරු

කාර්යක්ෂම දර උදුනක් නිර්මාණය කිරීමේ දී දහනය, තාප ප්‍රමාණය, තාප පරිහානිය හා එම දර උදුන නිපදවීමට යොදාගන්නා අමුද්‍රව්‍යය වැනි සාධක ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගනු ලබයි. ගින්නක් මෙලවීම සඳහා තාපය, ඔක්සිජන් සහ සුදුසු ඉන්ධනයක් අවශ්‍ය වෙයි. ඉන්ධන ලෙස ජීවස්කන්ධ පාවිච්චියේ දී, ජීව ස්කන්ධ වර්ගය, ප්‍රමාණය, හැඩය හා තෙතමනය දහනයේ ස්වභාවයට බලපානු ලබයි. උදාහරණයක් ලෙස කැබැලි කරන ලද දර, වාතය දැවටෙන පෘෂ්ඨ වර්ගඵලය වැඩි වීම නිසා වඩා කාර්යක්ෂම දහනයක් පෙන්නුම් කරයි. අනෙක් අතට තෙත් වූ දර හිතකර දහනයක් සඳහා සුදුසු නො වෙයි.

පූර්ණ දහනයක් සඳහා ඉන්ධනය මෙන්ම තාපය හා ඔක්සිජන් සුදුසු සංකලනයක් තිබීම ඉතා වැදගත් වෙයි. ගිනි දැල්ලේ උෂ්ණත්වය අවශ්‍ය අගයට වඩා අඩු මට්ටමක තිබීම, දර දුම් වැඩි කිරීමට හේතු වන අතර, මේ දුම කාබන් මොනොක්සයිඩ් (CO) හා දුඹුළුවලින් සමන්විත වේ. වැඩිදියුණු කළ ලිපක භාජනය හා ගිනි දැල්ල අතර පරතරය ප්‍රශස්ථ මට්ටමක පවත්වාගත යුතු ය. භාජනය ගිනි දැල්ලට වඩා කිට්ටු වීමෙන්, දැල්ලේ උෂ්ණත්වය අඩු වී දර දුම වැඩි වීමට තුඩු දෙයි. එමෙන් ම උදුන නිර්මාණයේ දී, දහනාගාරයට ප්‍රමාණවත් වාතය (ඔක්සිජන්) ලැබෙන පරිදි වා කවුළු නිර්මාණය කිරීමෙන් දහනය වඩාත් කාර්යක්ෂම වේ.

### 'අනගි' උදුනක කාර්යක්ෂමතාව ඉහළ නංවාලන තාක්ෂණික තොරතුරු

'අනගි' ලිප නිර්මාණයේ දී ඉහත කී සියලු ම තාක්ෂණික කරුණු සැලකිල්ලට ගෙන ඇත. දර පිරිමැසුම්දායී උදුනක ප්‍රධාන ලක්ෂණයක් විය යුත්තේ එයින් ජනිත වන තාපය එක්කාසු කොට භාජනය වෙතට යොමු කිරීමේ හැකියාවයි. සාම්ප්‍රදායික ගල් තුනේ ලිපකට සාපේක්ෂ ව 'අනගි' ලිපේ විශේෂත්වයක් වන්නේ ද එම කාරණයයි. 'අනගි' උදුනක කාර්යක්ෂමතාව 17%-21% දක්වා විචලනය වේ. ගල් තුනේ සාම්ප්‍රදායික ලිපක කාර්යක්ෂමතාව 5% - 10% වැනි අඩු අගයක් ගැනේ. 'අනගි' ලිපක් ආධාරයෙන් කි.වො. 4 - 6 ප්‍රමාණයක තාප ශක්තියක් ලබාගත හැකි වේ.

'අනගි' දර උදුනක් එක වර භාජන දෙකක් උණුසුම් කරගැනීමට අවස්ථාව සලසමින්, එකට යා වූ උදුන් දෙකක් පරිද්දෙන් නිමවා ඇත. මේ ලිපෙහි සියලු ම අංග මැටියෙන් නිර්මාණය වී ඇත.




| අංකය | 'අනගි' උදුනේ උපාංග | කාර්යය |
|---|---|---|
| 1. | දහන කුටිය | එක වර බඳුන් දෙකක් මඟින් පිසීම කාර්යක්ෂම කිරීමට ද්විතීයික වාත සැපයුම් දෙකකින් හා ප්‍රාථමික වායු සැපයුම් ඇති කිරීමට හා දර ඇතුළු කිරීමට කවුළුවකින් ද සමන්විත ය. |
| 2. | දර කවුළුව | මෙය දැව ඇතුළු කිරීමට හා ප්‍රමාණවත් වාත ධාරාවක් සැපයීමට ද අතිරික්ත දර භාවිතයක් සිදු නො වීමට ද නිර්මාණය කර ඇත. ලිප තුළට එන වාත ධාරාවේ වේගය වැඩි කිරීමට, විවරයේ වට රැල්ලේ පිට ධාරය පුළුල් වත්, ඇතුළත ධාරය පටුවටත් නිර්මාණය කර ඇත. |
| 3. | ප්‍රධාන ලිප් විවරය | දහන කුටිය ඉහළ වූ බඳුන් රඳවන ආධාරක තුනකින් සමන්විත විවරය. මෙහි මුදුන් ගැට්ට භාජනයක් තැබූ විට සම්පූර්ණයෙන් ආවරණය වන පරිද්දෙන් නිර්මාණය කොට ඇත. මෙසේ කිරීමෙන් ලිප තුළ තාපය හා ගිනි දැල් ඉලිප්සාකාර නළය ඔස්සේ දෙවැනි ලිප් විවරය කරා යොමු වෙයි. |
| 4. | ඉලිප්සාකාර නළය | දහන කුටිය හා දෙවැනි උදුන සම්බන්ධ කෙරෙන ඉලිප්සාකාර නළය |
| 5. | දෙවැනි ලිප් විවරය | දෙවැනි බඳුන රඳවන ගිනිදැල් අවරණය සවි කර ඇති විවරය. ඉලිප්සාකාර නළයෙන් පැමිණෙන තාපය මේ ලිප් විවරය කරා යොමු වෙයි. ප්‍රධාන ලිප් විවරය මෙන්, භාජනය තැබූ විට සම්පූර්ණයෙන් ආවරණය නො වන පරිද්දෙන් නිර්මාණය කොට ඇත. 'අනගි' ලිපෙන් උපරිම කාර්යක්ෂමතාවක් ලබාගැනීමට සැම විට ම ලිප් දෙක ම සුදුසු පරිදි භාවිතයට ගත යුතු වේ. |
| 6. | දෙවැනි බඳුන රඳවන ආධාරක තුන - | මෙමඟින් දෙවැනි ලිපේ භාජනයක් තැබූ විට පිට වන දුම්, සුදුසු ලෙස පිට වීමට ඉඩ සලසයි. |
| 7. | වාරකය | ඉලිප්සාකාර නළයෙන් පිටතට දිවක හැඩයට නෙරා එන ලෙස සකස් කළ මැටි තැටිය. මෙමඟින් දෙවැනි ලිප සඳහා තාපය සැපයීම කාර්යක්ෂම කර ඇත. |
| 8. | ගිනිදැල් ආවරණය | දෙවැනි භාජනයේ කාර්යක්ෂමතාව වැඩි වන ලෙස උදුන් කුහරය මත ඉහළින් සවි කර ඇති ආරක්ෂක පටිය - මෙමඟින් ප්‍රධාන උදුන මත ඇති භාජනයක් බාගන්නා විට දෙවැනි ලිපෙන් ගිනිදැල් වැදී ඇති විය හැකි පිළිස්සීම ද වළකාලයි. |
| 9. | සවිමත් කිරීමේ පටි | දෙවැනි ලිප සවිමත් කිරීම සඳහා ඉහළ සිට පහළට නිම වුණු පටි. |

17 වැනි පිටුවට

06 වැනි පිටුවෙන්

## ගල් තුනේ ලිප වෙනුවට 'අනගි' ලිපක් පාවිච්චියේ ඇති වාසි

1. ආහාර පිසීමට යන දර ප්‍රමාණය 40% - 60% ප්‍රමාණයක් අඩු කරගත හැකි ය. පිසීමේ ඉන්ධන සඳහා වැය වියදම ද සැලකිය යුතු ලෙස අඩු කරගත හැකි අතර, වැය වන කාලය ද 40%-50% කින් අඩු කරගත හැකි ය. එක් ආහාර වේලක් පිසගැනීමට උදුනේ ස්වාභාවය හා ඉන්ධන වර්ගය අනුව පර්යේෂණවලට අනුව ලබාගත් තොරතුරු පහත දැක්වේ.

**සුදු කැකුළු හාල් කි.ග්‍රෑ. 1, පරිප්පු ග්‍රෑම් 250, හාල්මැස්සන් ග්‍රෑම් 250ක් සහ මැල්ලුම් ග්‍රෑම් 400කින් යුත් ආහාර වේලක් පිසීම සඳහා විවිධ උදුන්වල සිදු කළ පර්යේෂණ**

| උදුනේ ස්වාභාවය (වර්ගය/ඉන්ධන) | වැය වන ඒකක වේලාව (විනාඩි) | වියදම (රු.ශ) |
|---|---|---|
| විදුලි උදුන (උෂ්ණත්වය පාලනය කළ හැකි) | 0.75 කි.වො.පැ. 50 | 20.80 |
| ගල් තුනේ දර ලිප 1.3 කි.ග්‍රෑ. | 50 | 15.60 |
| එල්. පී. ගෑස් උදුන (LP Gas) 0.15 කි.ග්‍රෑ. | 42 | 18.00 |
| අනගි දර උදුන 0.6 කි.ග්‍රෑ. | 25 | 7.20 |

**(කි.වො.පැ. 1 = රු. 27.75 දර කි.ග්‍රෑ. 1 = රු. 12.00, එල්. පී. ගෑස් කි.ග්‍රෑ. 1 = රු. 120.00, එල්. පී. ගෑස් සහ විදුලි තනි උදුන් මෙහි දී සලකා ඇත.)**

2. දර දුම් සහ දැලි ප්‍රමාණය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වීම සහ සෞඛ්‍යය හිතකර පරිසරයක් නිර්මාණය වීම.

අකාර්යක්ෂම දර දහනය නිසා පිට වන දුම් ආග්‍රහණය වීම විවිධ රෝගාබාධ ඇති වීමට හේතුකාරක වේ. ගෘහස්ථ වායු දූෂණය (Indoor Air Pollution) සඳහා ප්‍රධාන හේතු කාරකය ලෙස ආකාර්යක්ෂම දර දහනය හැඳින්විය හැකි ය. දර දුම් සමඟ විමෝචනය වන වායූන් හා ඒවායේ සෞඛ්‍ය බලපෑම් පහත පරිදි වේ. වැඩි ම බලපෑමකට ලක් වන්නේ ගෘහණියන් සහ කුඩා ළමයින් ය.

| දර දුම්වල අන්තර්ගත අහිතකර වායූන් | ඇති වන රෝග |
|---|---|
| කාබන් මොනොක්සයිඩ් (CO) | පුප්ඵුශීය රෝග |
| ක්ෂුද්‍ර අංශූන් PM (Particulate Matters) | ඇදුම |
| මීතේන් (CH4) ෆෝමල්ඩිහයිඩ් නයිට්‍රජන් ඔක්සයිඩ් (NOx) | ළය පිළිකා ක්ෂය රෝගය ශ්වසන රෝග, අක්ෂි රෝග, අඩු උපත් බර |

**ගල් තුනේ ලිපකට සාපේක්ෂව 'අනගි' ලිපකින් අඩු කරගත හැකි දර දුම් ප්‍රතිශතය:** (මොරටුව විශ්වවිද්‍යාල වාර්තාවකට අනුව)

| වායුව | ප්‍රතිශතය |
|---|---|
| කාබන් ඩයොක්සයිඩ් ($CO_2$) | 41% |
| කාබන් මොනොක්සයිඩ් (CO) | 1% |
| මීතේන් ($CH_4$) | 29.6% |
| සල්*ර් ඔක්සයිඩ ($SO_x$) | 41.2% |
| නයිට්‍රජන් ඔක්සයිඩ ($NO_x$) | 44.3% |
| ක්ෂුද්‍ර අංශූන් PM (Particulate Matters) | 28.4% |

ගෘහස්ථ වායු දූෂණය අවම කිරීමට, වැඩිදියුණු කරන ලද ලිපක් පමණක් නො සෑහෙන අතර, ඒ සඳහා මුළුතැන්ගෙය නිසි අයුරින් කළමනාකරණය ද විය යුතු ය. ලිපක් පාවිච්චියේ දී, එහි දුම් නිසි පරිදි ගෙයින් පිට වීම සඳහා චිමිනියක් හා දුම් කවුළු තිබීම අනිවාර්ය වන අතර ම මුළුතැන්ගෙයි රාක්ක, උපකරණ, ආහාර ද්‍රව්‍ය හා ජල පහසුව ක්‍රමවත් ව ස්ථානගත වීම ද වැදගත් ය. සරල ව කිව හොත් මුළුතැන්ගෙය ද සුදුසු පරිදි වැඩිදියුණු වීමෙන් ගෘහස්ථ වායු දූෂණය අවම කරගත හැකි ය.

3. ගෝලීය උණුසුම හා දේශගුණික විපර්යාස අවම කිරීමේ විසඳුමක් ලෙස

'අනගි' ලිපක් භාවිතයෙන් වසරකට නිකුත් වන කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය මෙට්‍රික් ටොන් භාගයකින් පමණ අඩු වන බව (ගල් තුනේ ලිපකට සාපේක්ෂ ව) තක්සේරු කර ඇත. 'අනගි' ලිප් 100,000ක් පාවිච්චියෙන් වසරකට කාබන් ඩයොක්සයිඩ් විමෝචනය වීම මෙට්‍රික් ටොන් 50,000කින් පමණ අඩු කරගත හැකි වේ. තව ද වන සම්පත අධි පරිභෝජනය අවම කිරීමට ද දායක වේ.



*ක්‍රමවත් හා වැඩිදියුණු කළ ග්‍රාමීය මුළුතැන්ගෙයක්*

### 'අනගි' ලිපේ උපරිම කාර්යක්ෂමතාව ලබාගැනීමට

- ලිපෙන් අපේක්ෂිත කාර්යක්ෂමතාව ලබාගැනීමට සෑම විට ම ලිප් දෙක ම පාවිච්චි කළ යුතු ය. දෙවැනි ලිපෙන් පිට වන තාපයෙන් ප්‍රයෝජන ගැනීමට, පිසීමේ දී වතුර භාජනයක් හෝ එම ලිප මත තබාගත යුතු වේ.
- වියළාගත් සහ කැබැලි කරගත් දර පාවිච්චිය දහනය පහසු කරගැනීමටත්, දුම අඩු කිරීමටත් දායක වේ. තව ද ලිපට තරම ඉක්මවා දර ඇතුළු නො කිරීමෙන් දහනයට අවශ්‍ය ඔක්සිජන් ප්‍රමාණය ඇහිරීම වළක්වාගත හැකි ය.
- වැඩි ආයු කාලයක් සහ හොඳ තාප පරිවහනයක් සඳහා 'අනගි' මැටි මිශ්‍රණයකින් (හුඹස් මැටි, වැලි, අළු, ගොම) පරිවරණය කිරීම වඩාත් සුදුසු වේ.

### මැටි ගසා පරිවරණය කරන ලද 'අනගි' ලිප



- භාවිත කරනු ලබන භාජනවල ප්‍රමාණය, ඝනකම, නිපදවා ඇති ද්‍රව්‍යය, පියන් පාවිච්චිය, පිසීමේ ක්‍රම මත ද පිසීමේ කාර්යක්ෂමතාව වෙනස් විය හැකි ය.

ග්‍රාමීය ජනතාවගේ පහසුව උදෙසා නව කාර්යක්ෂම දර උදුන් කාලීන අවශ්‍යතාවකි. දැනටත් බහුතරයක් වූ ශ්‍රී ලාංකිකයන්ට දැරිය හැකි හා පහසුවෙන් සපයාගත හැකි එක ම බලශක්ති ප්‍රභවය 'දර' වීම ඊට ප්‍රධානම හේතුව වේ.

**දුමිඳු හේරත්**
ඒකාබද්ධ සංවර්ධන සංගමය (Integrated Development Association)" මහනුවර (www.ideasrilanka.org)

**ඒකාබද්ධ සංවර්ධන සංගමයේ කාර්ය මණ්ඩලයට සහ බලශක්ති කළමනාකරුවන්ගේ සංගමයට විශේෂ ස්තුතිය හිමි වේ)**

## ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර ආශ්‍රිත වායුගෝලයේ දූෂණ මට්ටම අවම කරලීමට පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කරමු

මෑත කාලයේ දී අපි අන් කවරදාකටත් වඩා දේශගුණ විපර්යාස හේතුවෙන් බැට කන රාජ්‍යයක් බවට පත් ව සිටින්නෙමු. ජර්මන් වොච් ආයතනය මඟින් පසුගිය දා එළිදැක්වූ ලෝක දේශගුණ අවදානම් දර්ශකයේ 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකාව දෙවැනි ස්ථානය හිමි කරගෙන සිටියි. දේශගුණ විපර්යාසවලට ප්‍රධාන හේතුවක් වන කාබනික විමෝචනය සහ එය අවම කරලීමට ලෝකය අසමත් වීම දේශගුණ විපර්යාස තවදුරටත් වර්ධනය කරනු ඇත. පොසිල ඉන්ධන දහනය වර්තමානයේ සිදු වන වැඩි ම කාබනික විමෝචනයට උත්තේජනයක් වේ. මිනිසුන්ගේ අධි පරිභෝජන ජීවන රටාව තුළ පොදු ප්‍රවාහන සේවාව අතහැර පෞද්ගලික රථවාහන භාවිතාව වර්ධනය, පොසිල ඉන්ධන දහනයෙන් සිදු වන බලශක්ති උත්පාදනය සහ අනෙකුත් සියලු ම පොසිල ඉන්ධන ආශ්‍රිත කර්මාන්ත පෘථිවි වායුගෝලීය උණුසුම් මට්ටම වර්ධනය කරමින් වායුගෝලීය ජීව හිතකර බව අහිතකර බවට පත් කරමින් සිටියි. එහි භයානකත්වය අපට තේරුම්ගැනීමට හැක්කේ ඉන්දියාවේ නවදිල්ලි නුවර ඇති වී තිබෙන වායු දූෂණය වැනනක් අපට ද ඇති වූ දිනක වීමට පුළුවන.
වර්තමානයේ ශ්‍රී ලංකාවේ වායුගෝලයට විශාල ලෙස අහිතකර බලපෑමක් පෞද්ගලික රථ වාහන භාවිතාව නිසා සිදු වෙමින් පවතියි. සංඛ්‍යාලේඛනවලට අනුව ශ්‍රී ලංකාවේ මේ වන විට පෞද්ගලික රථ වාහන ලක්ෂ 80කට ආසන්න ප්‍රමාණයක් පවතියි. කොළඹ නගරය ගත් විට දිනකට අති විශාල රථවාහන ප්‍රමාණයක් නගරයට ඇතුළු වෙයි. සමහර විට සුළු දුරක් පවා යෑමට තනි පුද්ගලයෙක් සිය පෞද්ගලික මෝටර් රථය භාවිත කරයි. වායුගෝලය දූෂණය කරවීමට ප්‍රධාන හේතුකාරකයක් වන රථවාහනවලින් පිට වන අහිතකර දුමාරය අවම කරලීමට නම් බලධරයන් වහා ම කළ යුතු වන්නේ ශක්තිමත් කාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවාවක් ජනතාවට සැපයීමයි. ලෝකයේ බොහෝ දියුණු රාජ්‍යයන් මේ මොහොතේ සැලසුම් කරමින් සිටින්නේ නිදහස් ප්‍රවාහන පද්ධතියක් ජනතාවට ලබා දීමට ය. ලක්සම්බර්ග් රාජ්‍යය පසුගිය දා නොමිලේ දුම්රිය සේවාවක් ඇරඹීමේ මූලික කටයුතු ආරම්භ කළේ ය. එමෙන් ම පරිසර හිතකාමී ප්‍රවාහන ක්‍රමවේද දිරිගැන්වීමට ඔවුන් කටයුතු කරමින් සිටියි. ශ්‍රී ලංකාවේ කොළඹ නගරයේ වායුගෝලයේ පැවතිය යුතු වාතයේ ක්ෂුද්‍ර අංශු ප්‍රමාණය ගණනය කළ විට ඝන මීටරයකට මයික්‍රෝ ග්‍රෑම් 70ක් දක්වා වැඩි වී තිබිණි. එය සම්මත ව පැවතිය යුතු අගය වන්නේ ඝන මීටරයකට මයික්‍රෝ ග්‍රෑම් 50ක් ලෙස ය. මහනුවර නගරයේ වායුගෝලය ද අන්ත දූෂිත තත්ත්වයට පත් වෙමින් ඇත. පොසිල ඉන්ධන දහනය වායු දූෂණයට බලගතු බලපෑමක් කරන අතර පෞද්ගලික රථ වාහන භාවිතාව අධෛර්යවත් කොට පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කරලීමට වගකිවයුතු අංශ වහා කටයුතු කළ යුතු ය. එමඟින් ශ්‍රී ලංකාව තවත් නවදිල්ලියක් වීම යම්තාක් දුරකට අවම කරගත හැකි වනු ඇත.

**තිළිණ පිටවල** සංවිධායක, Fridays For Future දේශගුණ ව්‍යාපාරය.

**දුරේක්ෂයක් විකිණීමට**
ජර්මනියේ නිෂ්පාදිත
මි. මී. 76, පරාවර්තක
අභ්‍යාවකාශ දුරේක්ෂය
**විකිණීමට**
විශාලක බලයන් 35-350
රු. 18,000/- වාද්දුව
0705503421.